**ලංකා රාජ්‍ය තොරතුරු යටිතල පහසුකම් (පුද්ගලික) සමාගම - 2021**
**-------------------------------------------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මතය

ලංකා රාජ්‍ය තොරතුරු යටිතල පහසුකම් (පුද්ගලික) සමාගමේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ලාභ හා අලාභ ප්‍රකාශනය හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

සමාගමේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සමාගම අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය සමාගම ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සමාගමේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සමාගමේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරික්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, සමාගමේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

### 1.4 විගණන විෂය පථය

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන

තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්,චේතනාන්විත මඟහැරීමෙන්,වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද ,අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ සමාගමේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ සමාගමේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, සමාගම ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය

ගනුදෙනු කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරිබලය සහිතව ක්‍රියාත්මක කිරීම, අදාළ වන වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍ය වන පරිදි ගනුදෙනු සටහන් කිරීම සහ වත්කම් සඳහා ගිණුම් කටයුතුභාවය පවත්වාගෙන යාම, කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව පමණක් වත්කම්වලට ප්‍රවේශ වීම, සටහන් කරන ලද වත්කම් සඳහා වූ ගිණුම්කටයුතුභාවය පවත්නා වත්කම් සමඟ සාධාරණ කාල වකවානුවලදී සැසඳීම සහ වෙනස්කම් ඇතොත් ඒවා සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම ආදිය සඳහා සාධාරණ තහවුරුවක් ලබාගැනීමට ප්‍රමාණවත් ''මනාලෙස සැලසුම් කරන ලද'' අභ්‍යන්තර ගිණුම්කරණ පාලන පද්ධතියක් ආයතනය විසින් පවත්වාගෙන යාම අවශ්‍ය වේ.

### 1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2021 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු සේවක අර්ථසාධක අරමුදල් රු.264,680 ක් සහ සේවක භාරකාර අරමුදල් රු.39,702 ක් ගිණුම්ගත කර නොතිබුණි. තවද වැටුප් සැකසුම් සමාගමෙන් ලැබිය යුතු ශේෂය වන රු.304,382 ක් ණය ගැතියෙකු ලෙස ගිණුම්ගතකර නොතිබුණි.<br>එහි ප්‍රතිඵලයක් වශයෙන්, සමාගමේ ජංගම වත්කම් සහ වගකීම් එම මුදලින් අඩුවෙන් දක්වා තිබුණි. | දෙසැම්බර් මාසය සඳහා වන EPF සහ ETF ගෙවීම් සම්බන්ධයෙන්, අරමුදල් දැනටමත් SSP වෙත මාරු කර ඇති බැවින්, ඒවා ගෙවිය යුතු ලෙස අප ගණන් නොගත් බව පැහැදිලි කළ යුතුය.<br>නිවැරදිවම ප්‍රකාශ කිරීමේදී නම්, දෙසැම්බර් මාසය සඳහා EPF සහ ETF තාක්ෂණික වශයෙන් ගෙවිය යුතුව ඇති බව කෙනෙකුට තර්ක කළ හැකි අතර, එස්එස්පී වෙත මාරු කරන ලද මුදල දෙසැම්බර් අවසානයේ ලැබිය යුතු යැයි සැලකිය හැක. කෙසේ වෙතත්, අනාගතයේදී එවැනි සංකූලතා වැළැක්වීම සඳහා, අරමුදල් මාරු කළ මාසය තුළම EPF සහ ETF ගෙවීම් ක්‍රියාවට නංවන ලෙස අපි දැනටමත් SSP වෙත දැනුම් දී ඇත. | ලැබිය යුතු සහ ගෙවිය යුතු සියල්ල ගිණුම්ගත කළ යුතුය. |

### 1.5.3 සංවිධානයේ අඛණ්ඩ පැවැත්ම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2022 නොවැම්බර් 15 වැනි දින පැවති මව් සමාගමේ ( ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය ) හි අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී සමාගම් පනතේ 242 වගන්තියට අනුව සමාගම ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය සමඟ ඒකාබද්ධ කිරීමට අනුමැතිය ලබා දී ඇතත්, එය මූල්‍ය ප්‍රකාශණවල අනාවරණය කර නොතිබුණි. | ශේෂ පත්‍ර දිනය සහ මූල්‍ය ප්‍රකාශන නිකුත් කිරීමට අවසර දී ඇති දිනය අතර එනම් 2022 දෙසැම්බර් 15 වැනි දින LKAS 10 අනුව මෙම ඒකාබද්ධ කිරීමේ තීරණය ගෙන ඇත.<br><br>කෙසේ වෙතත්, මෙය වාර්තාකරණ කාල සීමාවෙන් පසුව ඇති වූ තත්වයන් සමඟ කටයුතු කරන බැවින් හෙළිදරව් කළ යුතු නොගලපන සිදුවීමකි. අප විසින් LKAS-10 ට අනුව අවශ්‍ය පරිදි මෙම ගැලපුම් නොවන සිදුවීම හෙළි කිරීමට අසමත් වීම පිළිගන්නෙමු. | ශේෂ පත්‍ර දිනයෙන් පසු සියලුම සිදුවීම් අනාවරණය කළ යුතුය |

**1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්**

**1.6.1 ලැබිය යුතු මුදල්**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2021 දෙසැම්බර් 31 දිනට මව් සමාගමෙන් (ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය) ලැබිය යුතු ශේෂය රු.44,001,286 ක් වූ අතර එය 2015 වසරේ සිට අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය විසින් ලංකා රාජ්‍ය තොරතුරු යටිතල පහසුකම් (පුද්ගලික) සමාගම සහ ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය ඒකාබද්ධ කිරීම හරහා මෙම අන්තර් සමාගම් ශේෂය පියවා ගැනීමට සැලසුම් කර ඇති අතර එය දැනට ක්‍රියාත්මක වෙමින් පවතී. | ලැබිය යුතු මුදල් ලබා ගැනීමට කටයුතු කළ යුතුය. |

**1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම**

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| අ) | 2007 අංක 07 දරන සමාගම් පනත, 133(1) වගන්තිය | සෑම වර්ෂයකටම වරක්ම කොටස් හිමියන්ගේ වාර්ෂික මහා සභා රැස්වීමක් පැවැත්විය යුතුය. සමාගම ආරම්භයේ සිටම වාර්ෂික මහා සභා රැස්වීමක් පවත්වා නොතිබුණි. | විගණනය සඳහා මූල්‍ය ගිණුම් සකස් කිරීමේ ප්‍රමාදය හේතුවෙන් වාර්ෂික මහා සභා රැස්වීමක් පැවැත්වීම ප්‍රමාද විය. තවත් එක් ඉදිරිපත් නොකල ගිණුමක් පවත්නා බැවින් එය ද අවසන් වූ විට , සමාගම් පනත මගින් නියම කර ඇති පරිදි වාර්ෂික මහා සභා රැස්වීමක් පවත්වන බවට අපි සහතික වන්නෙමු. | පනතේ සඳහන් විධිවිධාන අනුගමනය කළ යුතුය. |
| ආ) | 2021 නොවැම්බර් 16 දිනැති අංක 01/2021 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ, මෙහෙයුම් අත්පොතෙහි 6.6 පරිච්ඡේදය | මූල්‍ය වර්ෂය අවසන් වී දින හැටක් (60) ඇතුළත කෙටුම්පත් වාර්ෂික වාර්තාව සහ ගිණුම් විගණකාධිපති වෙත භාර දිය යුතු වුවද, 2021 වර්ෂය සඳහා වන මූල්‍ය ප්‍රකාශන දින 425කට පසුව විගණකාධිපතිවරයා වෙත භාරදී තිබුණි**.** | මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේ ප්‍රමාදයක් සිදු වූ බව අපි විසින් පිළිගන්නෙමු. 2016 වසරේ සිට අතපසු වූ කාර්යන් තිබීම මෙම ප්‍රමාදයට හේතු විය. කෙසේ වෙතත් දැනට 2021 මූල්‍ය ප්‍රකාශන ජාතික විගණන කාර්යාලය විසින් විගණනය කරමින් පවතින අතර 2022 සඳහා වන මූල්‍ය ප්‍රකාශන කෙටුම්පත් දැනටමත් සකස් කර ඇත. අපි ඉදිරියේ දී රජයේ දින දර්ශනය සමඟ නොකඩවා කටයුතු සිදු කරන බවට සහතික වෙමු.’ | චක්‍රලේඛ උපදෙස් අනුගමනය කර කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| ඇ) | 2014 පෙබරවාරි 17 දිනැති 01/2014 රාජ්‍ය මූල්‍ය චක්‍රලේඛය හි 05 පරිච්ඡේදය | සමාගම සංයුක්ත සැලැස්ම සහ 2021 වර්ෂය සඳහා ක්‍රියාත්මක කිරීමට නියමිත වාණිජ ක්‍රියාකාරකම් ඇතුළත් ක්‍රියාකාරී සැලැස්මක් සකස් කර නොතිබුණි | ලංකා රාජ්‍ය තොරතුරු යටිතල පහසුකම් (පුද්ගලික) සමාගම හි ආයතනික සැලැස්ම සහ ක්‍රියාකාරී සැලැස්ම ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනයෙ හි 2021 ආයතනික සැලැස්ම සහ ක්‍රියාකාරී සැලැස්ම යටතේ ඇතුළත් වේ.<br>එසේම, 2021 දී, ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය විසින් නිර්මාණය කරන ලද යෝජිත ඩිජිටල් උපාය මාර්ගය මඟින්, ආයතනික සැලැස්ම සහ ක්‍රියාකාරී සැලැස්ම යන දෙකෙහිම ලංකා රාජ්‍ය තොරතුරු යටිතල පහසුකම් (පුද්ගලික) සමාගම හි විශේෂාංග ඇතුළත් කළ ඩිජිටල් සේවා උපාය ආධාරකය මඟින් ලංකා රාජ්‍ය තොරතුරු යටිතල පහසුකම් (පුද්ගලික) සමාගම හි වැඩ විෂය පථය විස්තර කර ඇත. | චක්‍රලේඛ උපදෙස් අනුගමනය කළ යුතුය. සංවිධානයේ සැලැස්ම වෙන වෙනම හඳුනාගත යුතුය. |
| ඇ) | 2003 ජූනි 02 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක: පිඊඩී/12,<br>5.2.5 පරිච්ඡේදය | සමාගම 2021 වසර සඳහා අයවැය සකස් කර නොතිබුණි | ලංකා රාජ්‍ය තොරතුරු යටිතල පහසුකම් (පුද්ගලික) සමාගම , ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනයෙ හි පූර්ණ අනුබද්ධිත ආයතනයක් වන අතර ලංකා රාජ්‍ය තොරතුරු යටිතල පහසුකම් (පුද්ගලික) සමාගම වෙත වෙනම වාර්තා නොමැතිව ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය යටතේ ම අයවැය, ක්‍රියාකාරී සැලසුම්, වාර්ෂික අයවැය සහ ප්‍රසම්පාදන සැලසුම් සකස් කිරීමට කටයුතු කර ඇත. | චක්‍රලේඛ උපදෙස් අනුගමනය කළ යුතුය. අයවැය වෙන් වෙන් වශයෙන් හඳුනාගත යුතුය. |
| | පරිච්ඡේදය 9.2(ආ) | සමාගම සඳහා සංවිධාන සැලැස්මක් සකස් කර නොතිබුණි | ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය විසින් නිර්මාණය කරන ලද යෝජිත | චක්‍රලේඛ උපදෙස් අනුගමනය කළ යුතුය. සංවිධානයේ සැලැස්ම වෙන |

| | | | |
|---|---|---|---|
| | | ඩිජිටල් උපාය මාර්ග ඉදිරි ගමන තුළ ලංකා රාජ්‍ය තොරතුරු යටිතල පහසුකම් (පුද්ගලික) සමාගම හි විශේෂාංග ඇතුළත් ඩිජිටල් සේවා උපායමාර්ග ආධාරකය මඟින් ලංකා රාජ්‍ය තොරතුරු යටිතල පහසුකම් (පුද්ගලික) සමාගම හි වැඩ විෂය පථය විස්තර කර ඇත.<br>නිගමනය වශයෙන්, ලංකා රාජ්‍ය තොරතුරු යටිතල පහසුකම් (පුද්ගලික) සමාගම ඩිජිටල් සේවා ආධාරකය යටතේ ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය හි ආයතනික සැලැස්මේ කොටසක් ලෙස දක්වා ඇති බව. | වෙනම හඳුනාගත හැකි විය යුතුය |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.2,041,493 ඌනතාවයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.1,480,734 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.560,759 ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට ප්‍රධාන වශයෙන් රු.884,653 ක් වන වත්කම් ඉවත් කිරීමේ අලාභය හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 අරමුදල් ඌන උපයෝජනය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ලංකා බැංකුවේ අංක 0072839158 දරන බැංකු ගිණුමේ බැංකු ශේෂය රු. 350,742 2021 වසර තුළ භාවිත කර නොතිබුණි. | ලංකා රාජ්‍ය තොරතුරු යටිතල පහසුකම් (පුද්ගලික) සමාගම ගිණුම් අංක 0072839158 හි ඇති රු. 350,742 ශේෂය ලංකා රාජ්‍ය තොරතුරු යටිතල පහසුකම් (පුද්ගලික) සමාගම වෙත ලැබෙන ආධාරක සේවා ආදායම නියෝජනය කරයි.<br>ලංකා රාජ්‍ය තොරතුරු යටිතල පහසුකම් (පුද්ගලික) සමාගම මෙහෙයුමේ ක්‍රියාකාරීත්වයක් නොවීම හේතුවෙන් මෙම ශේෂය මාරු කර නොමැත.<br>කෙසේ වෙතත්, මෑතකාලීන අධ්‍යක්ෂ මණ්ඩලය පත් කිරීමත් සමඟ, මෙම මුදල් ජංගම ගිණුමේ තබා නොගෙන ප්‍රයෝජනයට ගැනීමට අපි සහතික වෙමු. | අරමුදල් ඵලදායී ලෙස භාවිතා කළ යුතුය. |

**3.2 වෙනත් සංවිධානවලට මුදාහළ සම්පත්**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සමාගම විසින් 2021 සහ 2022 වසරවලදී අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියකින් තොරව රු. 3,261,272ක වටිනාකමකින් යුත් ස්ථාවර වත්කම් ශ්‍රී ලංකා යුද හමුදාවට (ARMY) සහ තාක්ෂණ අමාත්‍යාංශයට පවරා තිබුණි. | තාක්ෂණ අමාත්‍යාංශයට සහ ශ්‍රී ලංකා හමුදාවට පවරා ඇති වත්කම් සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබා නොගන්නා බව පිළිගන්නා බව. | ස්ථාවර වත්කම් පැවරීමට පෙර අවශ්‍ය අනුමැතිය ලබා ගත යුතුය. |